(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 190.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 අගෝස්තු මස 22 අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා**, කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා**, නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**, නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා**, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය**, විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා**, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා**, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා**, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**, විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා**, ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා**, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා**, ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා**, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා**, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා**, කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා**, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **තිලක් මාරපන මහතා,** සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **මලිත් ජයතිලක මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **අනුර සිඩ්නි ජයරත්න මහතා**

ගරු **පියංකර ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **ලකී ජයවර්ධන මහතා**

ගරු **ප්‍රේමලාල් ජයසේකර මහතා**

ගරු **මයිල්වාගනම් තිලකරාජා මහතා**

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී :—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 අගෝස්තු 17 වැනි දින මා විසින් 'සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන)' පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**II**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත පිළිබඳ නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

ඉහත පනත් කෙටුම්පතට අදාළව අධිකරණය හමුවේ ගොනු කළ පෙත්සම සම්බන්ධයෙන් තවදුරටත් අධිකරණමය ක්‍රියාමාර්ගය පවත්වාගෙන යාමට බලාපොරොත්තු නොවන බව පෙත්සම්කරු විසින් දන්වා ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය දන්වා ඇත.

එමෙන්ම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනනුකූල නොවන බවට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම පිළිබඳ 12(4) ව්‍යවස්ථාවට අදාළ විධිවිධානවලට සහයෝගය දක්වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පළමු කාර්තුව සඳහා (2017.01.01 දින සිට 2017.03.31 දින දක්වා) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජන චීන සමූහාණ්ඩුව අතර උද්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 20 දිනැති අංක 2024/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්—

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 09 දිනැති අංක 2022/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 19 දිනැති අංක 2024/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 11 දිනැති අංක 2027/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2012 සහ 2013 වර්ෂ සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා විසින්, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු 142 වගන්තියේ (2) උපවගන්තියේ (ද) ඡේදය යටතේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 14 දිනැති අංක 2023/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග සෞඛ්‍යය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකාරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා විසින්, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ 1978 පෙබරවාරි 01 දිනැති අංක 302/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 07 දිනැති අංක 2026/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චමල් රාජපක්ෂ මහතා වෙනුවෙන් එහි සභික ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද "උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 117 - වැඩසටහන 2 දරන පරිපූරක ඇස්තමේන්තුව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ගාමිණී ලොකුගේ මහතා වෙනුවෙන් එහි සභික ගරු ලකී ජයවර්ධන මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 (1) වගන්තිය යටතේ නියෝග; සහ

(ii) 2011, 2012, 2015 සහ 2016 වර්ෂ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු සී. බී. රත්නායක මහතා වෙනුවෙන්, එහි සභික ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ නියෝග; සහ

(ii) 2016 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) දේශීය ආදායම් පනත් කෙටුම්පත;

(ii) මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය; සහ

(iii) උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 117 - වැඩසටහන 2 දරන පරිපූරක ඇස්තමේන්තුව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) (i) අම්බලන්තොට, පුහුල්යාය පාර, “ජයසෙවන” යන ලිපිනයෙහි පදිංචි ඥානවතී සමරවීර මහත්මියගෙන් ලැබුණු 2017.06.30 දිනැති පෙත්සම; සහ

(ii) අම්බලන්තොට, පලුගස්ගොඩැල්ල යන ලිපිනයෙහි පදිංචි එම්. පී. නන්දාවතී මහත්මියගෙන් ලැබුණු 2017.06.30 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කළුතර, මහ හීනටියන්ගල, අංක 18, “නිම්තෙර අසපුව” යන ලිපිනයෙහි පදිංචි පර්සි නානායක්කාර මහතාගෙන් ලැබුණු 2017.01.30 දිනැති පෙත්සම ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) පානදුර, අළුබෝමුල්ල, හොරණ පාර, අංක 245 දරන ස්ථානයෙහි පදිංචි එච්. ජී. ඩබ්ලිව්. පද්මසිරි මහතාගෙන් ලැබුණු 2017.07.24 දිනැති පෙත්සම;

(ii) පිටකෝට්ටේ, තලවතුගොඩ, විජිතපුරය, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි එල්. ඒ. ආර්. පී. කේ. ලියනආරච්චි මහතාගෙන් ලැබුණු 2017.07.24 දිනැති පෙත්සම; සහ

(iii) දොඩන්ගොඩ, උඩවත්තගොඩ, “සසිඳු” යන ලිපිනයෙහි පදිංචි පී. කේ. ඩී. රත්නසිංහ මහතාගෙන් ලැබුණු 2017.07.26 දිනැති පෙත්සම

ගරු සුජිත් සංජය පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 06 වැනි බදාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන) :** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 06 වැනි බදාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**7. පරිපූරක මුදල — ශීර්ෂය 117 — වැඩසටහන 02 :** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භවන 2017 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වන මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලක් හෝ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද ණය මුදලකින් හෝ රුපියල් බිලියන 53 (රු. 53,000,000,000) කට නොවැඩි පරිපූරක මුදලක් පහත දක්වා ඇති උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතු ය.

**උපලේඛනය**

ශීර්ෂය - 117 උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

| | | | | |
|---|---|---|---|---|
| | | | | <u>රුපියල් මිලියන</u> |
| ව්‍යාපෘතිය | - | 3 **අධිවේගී මාර්ග සංවර්ධනය** | | 31,200.00 |
| | | විදේශීය අරමුදල් (මූල්‍යකරණය 12) | 30,000.00 | |
| | | දේශීය අරමුදල් (මූල්‍යකරණය 17) | 1,200.00 | |
| | | (උපලේඛන අංක 01) | | |
| | - | 4 **මහාමාර්ග සංවර්ධනය** | | 15,800.00 |
| | | (විදේශාධාර හා සබැඳි දේශීය අරමුදල් හා විදේශීය ණය) | | |
| | | (උපලේඛන අංක 02) | | |
| | | විදේශීය අරමුදල් (මූල්‍යකරණය 12) | 14,500.00 | |
| | | දේශීය අරමුදල් (මූල්‍යකරණය 17) | 1,300.00 | |
| | | (උපලේඛන අංක 02) | | |
| | - | 6 **පාලම් සහ ගුවන් පාලම් ඉදි කිරීම** | | 6,000.00 |

(විදේශීය ණය) (මූලාකරණය 12)

(උපලේඛන අංක 03)

මුළු වියදම **53,000.00**

(රුපියල් බිලියන පනස් තුනක් පමණි.)

(අ. භා. 2.46 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.20 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.25 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග :** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 31 දිනැති අංක 2021/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ක්‍රීඩා පනත යටතේ නියෝගය :** ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 මැයි 05 දිනැති 2017/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම (මුලතිව් දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් මුල් හිමිකරුවන්ට ලබා දීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.35 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.21 ට, 2017 අගෝස්තු මස 23 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.